# ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණය: සෑම ළමයෙකුටම පරිගණකයක් යන වැඩසටහන ඇසුරෙන් සබරගමුව පළාත පදනම් කොට කෙරෙන අධ්‍යයනයක්.

විභාග අංකය - **FGS/M/MSSC/2006/22**

පශ්චාත් උපාධි අධ්‍යයන අංශය

කැලණිය විශ්වවිද්‍යාලය

කැලණිය

2006/2007



| ප්‍රවේශ අංකය: | 858 |
|---|---|
| වර්ග අංකය: | |



කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපති (ජනසන්නිවේදන) උපාධි පරීක්ෂණයෙහි අවශ්‍යතාවක් පරිපූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන ස්වාධීන නිබන්ධිකාවකි.

**ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණය: සෑම ළමයෙකුටම පරිගණකයක් යන වැඩසටහන ඇසුරෙන් සබරගමුව පළාත පදනම් කොට කෙරෙන අධ්‍යයනයක්**


**සාරාංශය**

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල අධ්‍යාපනය සඳහා ක්‍රියාත්මක තොරතුරු තාක්ෂණ වැඩසටහන් සාර්ථක ද සහ එමඟින් අධ්‍යාපනයට ප්‍රමාණවත් පිටිවහලක් ලැබේද යන ගැටලු මුල් කරගනිමින් මෙම අධ්‍යයනය සිදුකෙරිණ. එහිදී අධ්‍යයනයට පාදක කරගැනුණේ 'සෑම ළමයෙකුටම පරිගණකයක්' ව්‍යාපෘතියයි. ප්‍රශ්නාවලිය හා සහභාගීත්ව නිරීක්ෂණය යන අධ්‍යයන ක්‍රමවේද එහිදී භාවිත කෙරිණ. ග්‍රාමීය දරුවන් අධ්‍යාපනයට යොමුකිරීමට ව්‍යාපෘතියෙන් හැකියාව ලැබී ඇත. එහෙත් පරිගණකය ඇසුරෙන් පුළුල් අධ්‍යාපනික පරිසරයක් නිර්මාණය කරමින් දියුණුවන රටවල දරුවන් නවීන ලෝකය තුළ ඉදිරියට ගෙන යාමේ ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ ඉටු නොවේ. ඉලක්කගත කණ්ඩායම වෙත ගෙන යාමට සක්‍රීය යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොවීම ඊට ප්‍රධාන හේතුවයි. ග්‍රාමීය ප්‍රදේශවල සමාජ, ආර්ථික මෙන්ම ඇවතුම් පැවතුම්වලට අනුගත වන පරිදි මෙවැනි තොරතුරු තාක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව අධ්‍යයනයේ දී තහවුරු විය. ග්‍රාමීය ප්‍රදේශවල අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණ ක්‍රමවේද සකස් කිරීම සඳහා මෙමඟින් යෝජනා ඉදිරිපත් කර තිබේ.



*මූලපද:* තොරතුරු තාක්ෂණ වැඩසටහන්, ප්‍රශ්නාවලිය, සහභාගීත්ව නිරීක්ෂණය, සක්‍රීය යාන්ත්‍රණය